SOS ළමා ගම්මාන
ශ්‍රී ලංකාව

GENERATION
NEVER GIVE UP

ශ්‍රී ලංකාවේ
විකල්ප රැකවරණයෙන් සමුගන්නා
යෞවන යෞවනියන්ගේ

# සේවා නියුක්තිය ශක්තිමත් කිරීම



## 1. කාරක සාරාංශය

වර්තමාන ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව බහුලව පවතින ගැටළුවක් වන අතර වයස අවුරුදු 15-24 අතර තරුණ තරුණියන් අතර ඇති විරැකියා අනුපාතය සියලුම වයස් කාණ්ඩයන් අතරින් ඉහළම අගය වේ. තවද, අධ්‍යාපනය, රැකියාව හෝ පුහුණුව (NEETs) තුළ නොසිටින විශාල තරුණ ජනගහනයක් සිටින අතර ඔවුන්ගේ ප්‍රමාණය  මෙම වයස් කාණ්ඩයේ ගෝලීය සාමාන්‍ය අගයට  වඩා ඉහළ අගයක් ගනී. අවශ්‍ය නිපුණතා නොමැතිකම, පවතින අවස්ථා නොමැතිකම සහ පවතින රැකියා අවස්ථා සොයා ගැනීමේ දී මඟ පෙන්වීම් නොමැතිකම ඇතුළු විවිධ සාධක හේතුවෙන් ශ්‍රී ලාංකික තරුණ තරුණියන් පාසලෙන් රැකියාවට මාරුවීමේ දී අභියෝගයට ලක් වී තිබේ. කෙසේ වෙතත් විශාලතම බාධකය වන්නේ අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන, සේවා යෝජකයින් සහ තරුණයින් යන ප්‍රධාන පාර්ශවකරුවන් තිදෙනෙකු අතර තිබෙන විසන්ධි වීමයි: එහි ප්‍රතිඵලයක් ලෙස කුසලතා, තොරතුරු සහ අභිලාෂක ආදී පරතරයන් ඇති වේ. විකල්ප රැකවරණයෙහි හැදී වැඩුණු තරුණ තරුණියන් - විශේෂයෙන් ආයතනික රැකවරණය ලබන අය - රැකවරණය ලබන විට සහ ස්වාධීන ජීවිතයකට මාරුවීමේ දී ඔවුන් මුහුණ දෙන සුවිශේෂී තත්වයන් සහ අභියෝග හේතුවෙන් ඔවුන් දෙගුණයක් අවාසි සහගත තත්වයකට බඳුන් වේ. බොහෝ විට අපකීර්තියට හා වෙනස් කොට සැලකීම්වලට ගොදුරු විය හැකි අනන්‍යතාවයකින් සීමා වී ඇති ශ්‍රී ලංකාවේ රැකවරණ නිවාසවලින් ඉවත්ව යන තරුණ තරුණියන් (එනම් ‘රැකවරණය අතහරින්නන්’) ශ්‍රම ලෝකයේ වැඩ කිරීමේ අවශ්‍යතාවන්ට ඇතුළු වීම හා සැරිසැරීම වෙනුවෙන් අරගලයක යෙදෙති. අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය පුහුණුව, ව්‍යවසායකත්ව අවස්ථා හෝ යහපත් රැකියා ලබා ගැනීමේ ඔවුන්ගේ අපේක්ෂාවන් සාමාන්‍යයෙන් අඩු මට්ටමක පවතී. තවද, පවත්නා ක්‍රමවේදය සහ සමාජය විසින් නැවත නැවතත් අයුක්ති හා අශෝභන අයුරින් සැලකීම හේතුවෙන් බලය අහිමි කරවන ලද සහ අක්‍රිය කරවන ලද ඔවුන්, ලාභදායී හා අර්ථවත් රැකියාවක් කිරීමේ තම අභිලාෂයන් අත්හැර දැමීමට නැඹුරු වෙති. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම තරුණ පිරිස රැකවරණයෙන් ඉවත්වීමෙන් පසු බොහෝ විට ශ්‍රම වෙළඳපොලේ සූරාකෑම ඇතුළු අතිශයින්ම අවදානම් තත්වයන්ට තමන් විසින්ම මුහුණ දීම සඳහා අතහැර දැමීමට ලක් වේ. මෙම පාර්ශවකරුවන් සහ තරුණ තරුණියන් අතර ඇති පරතරය පියවා ගනිමින් රැකවරණයෙන් ඉවත්වී යන තරුණ තරුණියන්ගේ සේවා නියුක්තිය ශක්තිමත් කිරීම වෙනුවෙන් ප්‍රධාන වගකීම් දරන්නන් සඳහා, එනම් ප්‍රතිපත්ති සම්පාදකයින්, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන, සේවා යෝජකයින් සහ රැකබලා ගන්නන් වෙත නිර්දේශ කර තිබේ.

## 2. ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ රැකියා වියුක්තියේ ගැටලුව - ‘විසන්ධි වීම’

ශ්‍රී ලංකාවේ දැනට වයස අවුරුදු 15-24 අතර තරුණ තරුණියන් 3,177,132 ක් සිටින අතර එය මුළු ජනගහනයෙන් සියයට 15.5 කි[1]. අඩු මධ්‍යම ආදායම් ලබන රටක තත්වයක් කරා ළඟාවෙන ස්ථාවර ප්‍රගතියක් ලබා තිබුණ ද, ශ්‍රී ලංකාව දිගින් දිගටම අභියෝග රැසකට මුහුණ දී සිටින අතර, එහි දී අධ්‍යාපනය, රැකියා, සෞඛ්‍ය, පශ්චාත් යුද සංහිඳියාව හා සමාජ ඒකාබද්ධතාවය සහ ප්‍රජා සහභාගීත්වය හා දේශපාලන සහභාගීත්වය යන ක්ෂේත්‍රවල ගැටළු සමඟ පොරබදමින් සිටින තරුණයින් යනු වඩාත්ම බලපෑමට ලක් වූ කණ්ඩායම් අතරින් එකක් වේ [2].

ශ්‍රම වෙළඳපොළ වෙත මාරුවීම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට සැලකිය යුතු අභියෝගයක් වන අතර තරුණ විරැකියා අනුපාතය ඉහළ මට්ටමක පවතී. 2018 ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, තරුණ විරැකියා අනුපාතය (වයස අවුරුදු 15-24) සියයට 21.9 ක් වන අතර එය සියලුම වයස් කාණ්ඩ අතර වාර්තා වූ ඉහළම විරැකියා අනුපාතය යි. මෙය රටේ පාසැල්වල සිට රැකියා දක්වා සිදුවන පරිවර්තනය දුර්වල මට්ටමක පැවතීම පිළිබඳ සාක්ෂියකි. තවද, වයස අවුරුදු 15-24 අතර පිරිමින්ගේ හා කාන්තාවන්ගේ විරැකියා අනුපාතය පිළිවෙලින් සියයට 18.1 සහ 28.7 ක් වන අතර සියළුම වයස් කාණ්ඩයන් හි දී කාන්තාවන් අතර විරැකියාව පිරිමින්ට වඩා ඉහළ මට්ටමක පවතී. තරුණ හා කාන්තා විරැකියාව රටේ සමස්ත විරැකියා තත්වයට වැඩි දායකත්වයක් සපයයි [3]. මෙම සන්දර්භය තුළ, අධ්‍යාපනය, රැකියාව හෝ පුහුණුව (NEET) තුළ නොසිටින තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවක් සිටීම සැලකිලිමත් විය යුතු ප්‍රධාන හේතු කාරණයකි. NEET සමන්විත වන්නේ රැකියා විරහිතයන් - රැකියාවක් නොමැති නමුත් ක්‍රියාශීලීව රැකියාවක් සොයන අය සහ කිසිදු අධ්‍යාපනික හෝ පුහුණු කටයුත්තක නිරත නොවන ශ්‍රම බලකායෙන් පිටත අක්‍රිය තරුණ තරුණියන් ගෙන් ය. ශ්‍රී ලංකාව විසින් 2017 දී NEET අනුපාතය සියයට 22.7 ක් [4] ලෙස වාර්තා කරනු ලැබූ අතර එය අයි එල් ඕ ගෝලීය සාමාන්‍ය ඇස්තමේන්තුව වන සියයට 22.1 ට [5] වඩා ඉහළ අගයක් ගනී. NEET අනුපාතිකය පිරිමින්ට වඩා කාන්තාවන් අතර සැලකිය යුතු ලෙස ඉහළ අගයක් (පිළිවෙලින් 30.2% සහ 14.8%) ගන්නා අතර, වයස අවුරුදු 20-24 අතර වැඩිහිටි තරුණ කණ්ඩායම අතර දී ඔවුන්ගේ අනුපාතය සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගනී. ප්‍රතිපත්ති අධ්‍යයන

[1] *ජනගහන හා නිවාස සංගණනය (2012) සංගණනය හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

[2] *ශ්‍රී ලංකාවේ ජාතික මානව සංවර්ධන වාර්තාව (2014). එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන*

[3] *ශ්‍රී ලංකා ශ්‍රම බලකා සංඛ්‍යාලේඛන කාර්තුමය ප්‍රකාශනය 4 වන කාර්තුව (2018) සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

[4] *ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණ වාර්ෂික වාර්තාව (2017) සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

[5] *යෞවනය සඳහා වන ගෝලීය රැකියා ප්‍රවණතා 2017 තරුණ ශ්‍රම වෙළඳපොළවල දුර්වලතා යතාතත්වයට පත්වීම වෙනුවෙන් පුළුල් ප්‍රතිචාරයක් අවශ්‍ය වේ. අයි එල් ඕ ප්‍රවෘත්ති 20 නොවැම්බර් 2017* https://www.ilo.org/global/about-the-ilo/newsroom/news/WCMS_597065/lang--en/index.htm

ආයතනය (අයි පී එස්) විසින් මෑතක දී කරන ලද විශ්ලේෂණයකට අනුව, වයස අවුරුදු 15-19 අතර ළමුන් 6,656 ගෙන් 74% ක් 2016 දී අධ්‍යාපනයෙහි නිරත වී සිටි අතර, වයස අවුරුදු 20-24 අතර සේවයේ යෙදී වී සිටින්නේ මෙම සංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩු, එනම් 42% ක ප්‍රමාණයක් පමණි. මෙයින් ඇඟවෙන්නේ තරුණ ශ්‍රී ලාංකිකයන් අධ්‍යාපනයේ සිට රැකියාවට මාරුවීමේ දී අභියෝගයන්ට මුහුණ දෙමින් සිටින අතර එමඟින් පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු ඔවුන් NEET තත්වයට පත්වීමේ අවදානම ඉහළ බවයි. අවශ්‍ය නිපුණතා නොමැතිකම, පවතින අවස්ථාවන් නොමැතිකම, හෝ පවතින රැකියා අවස්ථා සොයා ගැනීමේ දී මඟ පෙන්වීම හා මාර්ගයන් නොමැතිකම ඇතුළු විවිධ සාධක හේතුවෙන් පාසැලේ සිට රැකියාවට මාරුවීම අභියෝගාත්මක විය හැකිය [6].


පර්යේෂණ වලින් තහවුරු වන පරිදි, ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගේ විරැකියාව ප්‍රධාන පාර්ශවකරුවන් තිදෙනෙකු අතර පවතින විසන්ධි වීම සමඟ ප්‍රබල සහසම්බන්ධයක් තිබේ: අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන, සේවා යෝජකයින් සහ තරුණයින්. තරුණ ශ්‍රම වෙළඳපොළ ඇගයීම් 2017 මගින් මෙය නිදර්ශනය කර තිබෙන අතර, ඉහළ තරුණ විරැකියාව සහ රට තුළ පවතින රැකියා අවස්ථා විශාල සංඛ්‍යාව අතර ඇති විරුද්ධාභාසය හිඩැස් හෝ නොගැලපීම් තුනක් භාවිතා කරමින් පැහැදිළි කරයි [7].

**1. කුසලතා පරතරය** - කුසලතා පරතරය යන්නෙන් අදහස් කරන්නේ සේවා යෝජකයින් විසින් ඉල්ලා සිටින කුසලතා සහ වර්තමාන හා අනාගත සේවකයින් අතර ඇති කුසලතා අතර ඇති විෂමතාවයයි: මෙම පරතරය මගින් පෙන්නුම් කරන්නේ අධ්‍යාපන ආයතන විසින් වෙළඳපල අරමුණු කරගත් කුසලතා අනුව සිසුන් සන්නද්ධ නොකරන බවයි.

**2. අභිලාශ පරතරය** - තරුණ පරපුර ඉහළ රැකියා සුරක්ෂිතභාවය, සමාජ තත්ත්වය, වඩා හොඳ වැටුප් සහ ප්‍රතිලාභ සහිත රැකියාවන් කිරීමට අපේක්ෂා කරන හෙයින් අභිලාශ පරතරය ඇතිවේ: කෙසේ වෙතත්, ශ්‍රම වෙළඳපොළට එවැනි රැකියා අවස්ථා ලබා දිය නොහැකි වූ විට, පවතින අවස්ථාවන් සඳහා ශ්‍රමයේ හිඟයක් පවතී.

**3. තොරතුරු පරතරය** - තොරතුරු පරතරය ඇති වන්නේ සේවායෝජකයින්ගෙන් තරුණයින්ට හා ශ්‍රම වෙළඳපොළට රැකියා සදහා අවශ්‍ය නිපුණතා සහ රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු ගලා යාම ප්‍රමාණවත් නොවීමෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස තරුණ තරුණියන් තෝරාගත් කර්මාන්ත හා වෘත්තීන් වෙත යොමුවීමට නැඹුරු වන අතර එමඟින් සංචාරක හා ඉදිකිරීම් වැනි වේගයෙන් වර්ධනය වන කර්මාන්ත කිහිපයක ශ්‍රම හිඟයක් ඇති වේ.

විශාල වශයෙන් ඇති බාධකය නම්, ඉහත සඳහන් පාර්ශවකරුවන් අතර සම්බන්ධතාවයේ පවත්නා ඌණතාවය යි. මෙම තත්වය පොදුවේ රටේ තරුණ ජනගහනයට බලපාන අතර, එය දෙමාපියන්ගේ රැකවරණය නොමැති අය හෝ විකල්ප රැකවරණයෙහි හැදී වැඩුණු අය වැනි ආන්තික හා අවදානමට ලක්විය හැකි තරුණ කණ්ඩායම් කෙරෙහි වඩාත් ගැඹුරින් බලපානු ඇති අතර බොහෝ විට පද්ධතියේ ඉරිතැලීම් විවරයන්ගෙන් ඔවුන් ඉවතට වැටේ.




රූප සටහන 1 : විසන්ධිවීම

[6] ශ්‍රී ලංකාවේ නීති අනුපාතිය පහත හෙළිම සුමට ලෙස පාසලෙන් වැඩබිමට මාරුවීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආතනයේ (අයිපීඑස්) බ්ලෝග් අඩවිය වන කතාකරන ආර්ථික විද්‍යාව 24 ජනවාරි 2019 http://www.ips.lk/talkingeconomics/2019/01/24/lowering-sri-lankas-NEETs-need-for-smoother-school-to-work-transitions/

[7] තරුණ ශ්‍රම වෙළඳපොළ ඇගයීම ශ්‍රී ලංකාව (2018). YouLead, Verite Research & USAID.

## 3. ශ්‍රී ලංකාවේ රැකබලා ගැනීමේ සේවාවන්ගෙන් ඉවත්ව යන යෞවන යෞවනියන්ගේ සේවා නියුක්තිය

දෙමාපියන්ගේ රැකවරණය අහිමි වූ ළමයින්ට සහ යෞවනයින්ට ශ්‍රම වෙළඳපොළේ පවතින අභියෝගයන් මෙන්ම සමාජයෙන් ඉවත්ව බැහැරට යාමේ හා දරිද්‍රතාවයට ලක්වීමේ අවදානම විශේෂයෙන්ම ඉහළ වේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු හැදී වැඩෙන්නේ SOS ළමා ගම්මාන වැනි පවුල් හා සමාන රැකවරණයක දී හෝ නේවාසික හා ආයතනික රැකවරණයක දී ය (දේශීය සන්දර්භය තුළ ඒවා බොහෝ විට හැඳින්වෙන්නේ ''ළමා නිවාස'' අනාථ නිවාසී සහ ''ළමා සංවර්ධන මධ්‍යස්ථාන'' වශයෙනි). එවැනි රැකවරණ ස්ථානවලින් ඉවත්ව යන යෞවන යෞවනියන්ට, එනම් ''රැකවරණය හැර යන අයට'' බොහෝ විට ඔවුන්ගේ සම වයසේ අනෙක් අයට මෙන් නොව ඔවුන්ට වඩා බොහෝ ඉක්මණින් ස්වාධීන වීමට බල කෙරෙයි. විකල්ප රැකවරණ පහසුකම්වල, වීථියේ හෝ වෙනත් අස්ථිර තත්වයන් යටතේ සිටි, දෙමාපියන්ගේ රැකවරණය නොමැතිව කාලය ගත කළ යෞවන යෞවනියන් තුළ බොහෝ විට මුල් වැඩිහිටිභාවයට සංක්‍රමණය වන විට ලබා ගත හැකි චිත්තවේගීය, සමාජීය හා මූල්‍යමය ආධාරවල අඛණ්ඩ ප්‍රභවයක් නොමැත. එමනිසා, තරුණ වියේ පසුවන රැකවරණ අත්හරින්නන්ට රැකියාවක් සොයාගැනීම ඉතාමත්ම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, දුර්වල අධ්‍යාපනය මෙන්ම සමාජ ආධාරක ජාල, වෘත්තීය උපදේශනය හා කුසලතා පුහුණුව, ධනාත්මක ආදර්ශයන් සහ සේවා පළපුරුද්ද නොමැතිවීම හේතුවෙන් ආර්ථික ස්වාධීනත්වය වෙත මාරුවීම ඔවුන්ට වඩාත්ම විශාල අභියෝගයක් වේ. රැකියා වෙළඳපොළෙන් සහ රැකියා අවස්ථාවන්ගෙන් තමන් විසන්ධි වී ඇති බවක් ඔවුන්ට හැඟෙන අතර, ඔවුන්ගේ ජීවිතයේ මෙම නව තීරණාත්මක අවධිය උදෙසා උපදේශනය, මග පෙන්වීම, කුසලතා සංවර්ධනය සහ පුහුණු කිරීම ඔවුන් විසින් ඉල්ලා සිටී. රැකබලා ගැනීමෙන් ඉවත් වී යන ආබාධිත වූ අය රැකියාවක් සොයන විට දී ඔවුන් අන් අයට වඩා දෙගුණයක් අවාසි සහගත තත්වයක සිටින බව පෙනේ.

ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ පහසුකම් ආයතන 405 ක් තුළ වාසය කරන ළමුන් 13,055 ක් දැනට සිටිති. [8] කෙසේ වෙතත්, මෙම තොරතුරු ග්‍රහණය කර ගැනීම සඳහා ක්‍රමානුකූල ක්‍රියාවලියක් ලෙස රැකවරණය අත්හරින්නන්ගේ සංඛ්‍යාව පිළිබඳ නිසි දත්ත තවමත් සංවර්ධනය කර නොමැත. SOS ළමා ගම්මානවල සහ ළමා රැකවරණ ආයතනවල රැකවරණය හැරගිය අය සමඟ සිදු කරන ලද උපදේශන මගින් සනාථ කෙරෙන රැකවරණයෙන් ඉවත්ව යන තරුණ තරුණියන්ගේ සේවා නියුක්තියට බලපාන ප්‍රධාන කරුණු කිහිපයක් පහත දැක්වේ. තරුණ තරුණියන්ට බලපාන මෙම ගැටළු සමහරක් පෙනෙන ප්‍රමාණයට වඩා බෙහෙවින් ගැඹුරු මට්ටමකට බලපාන බව හෝ නැතහොත් මේ ආකාරයේ ලේඛනයක් මගින් ලබා දිය නොහැකි බව සැලකිල්ලට ගත යුතු ය.

- උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පත (NIC) ඇතුළු නිසි නීතිමය ලියකියවිලි නොමැති වීම ප්‍රමුඛ ගැටලුවකි. 'ස්වේච්ඡා නිවාසවලින් සියයට 60 කටත් වඩා අඩු ප්‍රමාණයක් විසින් තමන් සත්කාරකත්වය දරණ සෑම දරුවෙකුගේම උප්පැන්න සහතිකය තමන් සතුව ඇති බව ප්‍රකාශ කරන බව [9] පර්යේෂණවලින් හෙළි වී තිබේ. උප්පැන්න සහතිකයට අදාළ ගැටළු වලට පියාගේ නම සහ දෙමව්පියන්ගේ විවාහක තත්ත්වය වැනි අසම්පූර්ණ තොරතුරු ඇතුළත් වන විට දී අපකීර්තියක් ඇති කරවන අතර ඊට අමතරව රජයේ නිලධාරීන් ද ඇතුළුව සේවා සපයන්නන් විසින් ද එසේ ලබාදෙන 'විය හැකි' උප්පැන්න සහතිකය නොපිළිගැනීම හා ඒ පිළිබඳව ඔවුන්ගේ දැනුවත්භාවය නොමැතිවීම ද ප්‍රායෝගිකව සිදු වේ. මෙවැනි ගැටළු නිසා බොහෝ විට පාසල් හෝ උසස් අධ්‍යාපනය හා නිපුණතා සංවර්ධන අවස්ථා ලබා ගැනීමට ඇති අවස්ථාවන් අහිමිවී යාම, රැකියාවලට බඳවා ගැනීමේ දී වෙනස් කොට සැලකීම සහ සේවා ස්ථානයේ කොන් කිරීම ආදිය සිදු වේ. ජාතික හැඳුනුම්පතෙහි ළමා රැකවරණ ආයතනයේ නම සහ ලිපිනය දක්නට ලැබීම ද ණය ලබා ගැනීම ආදී පහසුකම් වෙත ප්‍රවේශවීමේ දී ඔවුන් වෙත අපකීර්තිය, වෙනස් කොට සැලකීම සහ අභියෝගවලට සමාන බලපෑම් ද ඇති කරවයි.

- ළමා රැකවරණ ආයතන එකිනෙක හරහා විවිධ ස්ථානවලට මාරුවීම් හෝ එකින් එකට ගමන් කිරීමට සිදු වීම ද සාමාන්‍යයෙන් සිදුවන භාවිතයක් වන අතර ඒ හේතුවෙන් ද අස්ථාවරත්වය ඇතිවීම, අධ්‍යාපන කඩාකප්පල් වීම සහ අවසානයේ දී තමන්ගේ අභිප්‍රේරණය නැතිවීම ද සිදු වේ. රැකවරණ පරිසරය වෙනස් කිරීම බොහෝ විට ළමයින්ගේ චර්යාත්මක ගැටළු වලට ප්‍රතිචාර වශයෙන් අදාළ නිලධාරීන් විසින් බොහෝ විට අනුගමනය කරනු ලබන විසඳුම වන නමුත් මෙම දරුවන් ඔවුන්ගේ ජීවිත ගමනේ දී ඇති වන ක්ෂතිමය තත්වයන් හේතුවෙන් මෙම චර්යාමය ගැටළු ඇති වේ. කෙසේ වෙතත්, රැකවරණ ආයතනවල රැකබලා ගන්නන් බොහෝ විට එවැනි ගැටළු සංවේදීතාවයෙන් හා ඉවසීමෙන් කළමනාකරණය කිරීම වෙනුවෙන් සන්නද්ධ වී නොමැත. පාසල් සහ වෙනත් අධ්‍යාපන ආයතනවල දී ද මෙම යෞවන යෞවනියන්ට සහයෝගය දැක්වීම වෙනුවෙන් මෙන්ම අධ්‍යාපන සැකසුම් සමඟ ඔවුන්ගේ (නැවත) ඒකාබද්ධ වීමට පහසුකම් සැලසීම වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක නොවේ.

- සමහර ළමා රැකවරණ ආයතන විසින් දිනපතාම ළමයින්ට ගොවිපල වගාව වැනි දැඩි ක්‍රියාකාරකම්වල යෙදීමට බල කරන අතර එමඟින් ඔවුන්ට ඉගෙනීම සඳහා

[8] වාර්ෂික සංඛ්‍යානමය වාර්තාව (2017). පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව.

[9] *Out of Sight, Out of Mind: A Report on Voluntary Residential Institutions for Children in Sri Lanka: Statistical Analysis (2007). UNICEF.*

ඔවුන්ට ඉතිරිවන්නේ ඔවුන්ගේ සුළු කාලයක් හා සුළු ශක්තියක් පමණි. මෙය අධ්‍යාපනයේ ප්‍රගතියට විශාල බාධාවක් වන අතර නොවැළැක්විය හැකි ලෙස ඔවුන්ගේ සේවා නියුක්තියට එමගින් බාධා ඇති කරයි. තවද, වයස සම්පූර්ණවීමත් සමඟ රැකවරණයෙන් ඉවත් වී යන තරුණ තරුණියන් ඔවුන්ට වෙනත් අභිලාෂයන් හෝ වැඩි හැකියාවන් තිබියදීත් වගකීමක් පිළිබඳ හැඟීමක්, නවාතැන් අවශ්‍යතාවය සහ / හෝ වඩා හොඳ විකල්ප සහ අවස්ථාවන් නොමැතිකම හේතුවෙන් රැකවරණ ආයතනයේම දිගටම වැඩ කිරීම සඳහා කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර ගැනීම සිදුවේ.

- ඉහත සඳහන් කළ ''තොරතුරු පරතරය'' අනුව, යෞවන යෞවනියන්ගේ කුසලතා හා අභිලාශයන්ට ගැලපෙන පවත්නා රැකියා පිළිබඳ තොරතුරුවල මෙන්ම මෙම රැකියා සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වල ද හිඟතාවයක් තිබේ. රැකවරණය ලබන ළමුන් සහ යෞවන යෞවනියන් බොහෝ විට සංවෘත පරිසරයක් තුළ ජීවත් වීමත් එහි දී පිටත සමාජය සමඟ ඇත්තේ සුළු නිරාවරණයක් හා මද සමාජ අන්තර් ක්‍රියාකාරිත්වයක් වීම නිසා සහ දැනුමැති රැකබලා ගන්නන් නොමැතිවීම නිසා ද මෙය තව තවත් උග්‍ර වේ.

- සමහර ළමා රැකවරණ ආයතන විසින් වෘත්තීය පුහුණුව ලබා දුන්න ද, තරුණ තරුණියන් රැකවරණය තුළ දී / රැකවරණයෙන් ඉවත්ව යාමේ දී ඔවුන්ගේ සේවා නියුක්තිය ශක්තිමත් කිරීම වෙනුවෙන් මෙම වැඩසටහන් වල පවත්නා ගුණාත්මකභාවය හා ඵලදායීතාවය පිළිබඳ තත්වය සැමවිටම සහතික වන්නේ නැත. ඔවුන්ට ලබා දෙන වෘත්තීය පුහුණු පාඨමාලා බොහෝ විට ඔවුන්ගේ කුසලතාවන්ට හෝ අභිලාශයන්ට ගැලපෙන ඒවා නොවෙන අතර ඒවා ලබා ගැනීම ද ආයතනයේ විශේෂිත පාඨමාලාවක් තිබීම හෝ එහි මූල්‍ය සම්පත් තිබීම මත රඳා පවතී.

- වෘත්තීය අධ්‍යාපනය සාමාන්‍යයෙන් තරුණ සේවා නියුක්තිය ඉහළ නැංවීමේ මාර්ගයක් ලෙස වටහාගෙන ඇතත්, රැකවරණය අතහැර ගිය යෞවන යෞවනියන් සමඟ සිදුකළ සමහර උපදේශනවලින් හෙළි වූයේ වෘත්තීය පුහුණුව සෑම විටම කුසලතා හා වෘත්තීය සංවර්ධනය සඳහා ආකර්ශනීය මාර්ගයක් ලෙස නොසැලකෙන බවයි. වෙනත් ආකාරයක උසස් අධ්‍යාපනයට වඩා සාපේක්ෂව එය''අඩු''ශ්‍රේණියක්ය යන අදහසින් එවැනි පුහුණුවක් ලබා ගැනීමට ඔවුන් ඇතැම් විට පසුබට වේ.

- මෘදු කුසලතා නොමැතිකම සහ රැකියා විශේෂිත තාක්ෂණික කුසලතා ඇති අයදුම්කරුවන්ගේ හිඟය සේවා යෝජකයින් මුහුණ දෙන ප්‍රධාන බඳවා ගැනීම් සම්බන්ධ අභියෝග දෙකකි. ඉංග්‍රීසි භාෂා කුසලතා පරතරය විශාලතම කුසලතා පරතරයන්ගෙන් එකක් වන අතර, පර්යේෂණයන්ට අනුව, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් නොමැති පුද්ගලයෙකු ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් ඇති සමාන පුද්ගලයකු සමඟ සාපේක්ෂව සසඳන විට එම තැනැත්තා NEET තත්වයට පත්වීමේ අවදානම 9 කින් පමණ අඩු වේ. [10] ඉංග්‍රීසි භාෂා නිපුණතාවයේ පවත්නා ඌණතාවය බහුතරයක් වූ රැකවරණය හැරගිය අය මුහුණ දෙන පොදු ගැටළුවක් වන අතර එමඟින් ඔවුන්ව ඉතාම අවාසි සහගත තත්වයකට පත් වේ. මෙම බාධකය හේතුවෙන් ඔවුන්ට බොහෝ යහපත් අධ්‍යාපන හා රැකියා අවස්ථා අහිමි වේ. ඊට අමතරව, රැකවරණයෙන් ඉවත්ව යන තරුණ තරුණියන්ට සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීම සඳහා අවශ්‍යවන පුහුණුව, ජීව දත්ත සංවර්ධනය කිරීම, නායකත්ව කුසලතා, ඉලක්ක සැකසීම වැනි මෘදු කුසලතාවයන් ද අවශ්‍ය බව හැඟේ.

- රැකවරණය අත්හරින්නෙකු සඳහා තමන්ගේම වූ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී පවතින අපේක්ෂාවන් සීමිත වන්නේ ආරම්භක ප්‍රාග්ධනය හෝ කුසලතා නොමැතිකම නිසාම පමණක් නොව ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය උපකාරක ලියකියවිලි උදා. විදුලි බිල් ආදිය ද අවශ්‍ය වීමෙනි. සමහරක් යෞවන යෞවනියන් තවමත් රැකවරණ නිවාසයේ හෝ තාවකාලික ලිපිනයක ජීවත් වන බැවින් ඔවුන්ට මෙම ලියකියවිලි ලබා දිය නොහැක.

- රැකියා බඳවා ගැනීමේ ක්‍රියාවලීන්හි දී මෙන්ම රැකියා ස්ථානවල දී ද ''අනාථයෙකි'' නෙරපා හරින ලද්දෙකි සහ ''හොඳ පවුලකින් නොපැමිණිනු අයෙකි'' ආදී වශයෙන් හේතු දක්වමින් රැකවරණය හැරයන්නන් බොහෝ විට අපකීර්තියට හා වෙනස් කොට සැළකීමට ලක් වේ. එහි දී ඔවුන්ගේ කුසලතා, සුදුසුකම් සහ දායකත්වය හඳුනා ගැනීම වෙනුවට ඔවුන්ගේ අනන්‍යතාවයේ එක් අංශයක් කෙරෙහි පමණක් අවධානය යොමු කෙරේ. තව ද, සේවායෝජකයින් උපකල්පනය කරන්නේ රැකවරණ පහසුකම් වල සිට පැමිණෙන තරුණ තරුණියන් සතුව අවශ්‍යවන කුසලතා හෝ ආකල්ප නොමැති බව යි. එම ආන්තික පක්ෂග්‍රාහී වීමේ දී සුදුසුකම් ලත් තරුණ තරුණියන්ට ඔහුව / ඇයව ඔප්පු කිරීමට අවස්ථාවක් නොලැබී වටිනා අවස්ථාවන් අහිමි වේ. සේවා යෝජකයින්ගේ සහ සම සේවකයින්ගේ එවැනි හැඟීම් සහ ආකල්ප හේතුවෙන් මෙම තරුණ තරුණියන්ට තම අනන්‍යතාවය සැඟවීමට බල කරනුයේ හංවඩු ගැසීමට, පහළ හෙළීමට හා අවස්ථාවන් අහිමි වීමට ලක්වේ යැයි ඇතිවන සිදුවෙන භීතිය නිසා ය.

- පාසැලේ සිට වෘත්තීයට මාරුවීම සඳහා යෞවන යෞවනියන් නිරත කරවා ගැනීමට සහ ඒ සඳහා ඔවුන්ට උපකාර කිරීමේ දී දෙමාපියන්ගේ මග පෙන්වීම ඉතාමත් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන බව පර්යේෂණවලින් ඔප්පු වී තිබේ. මනා උගත් වැඩිහිටියන් නොමැති නිවසකට වඩා අවම වශයෙන් එක් වැඩිහිටියෙකු හෝ සාමාන්‍ය පෙළ සමත් වූ නිවසක ජීවත් වීමේ දී නීට් වීමේ අවස්ථාව අඩු කරයි. කණගාටුවට කරුණ නම්, ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ ආයතනවල සිටින කාර්ය මණ්ඩලයෙන් 44% ක් පමණක් වෘත්තීය පුහුණුව ලබා තිබීමත් දෙනා පමණ ඉගෙනුම ලබා තිබෙන්නේ 11 ශ්‍රේණිය හෝ ඊට අඩුවෙන් පමණක් වීමයි. [11] එබැවින් බොහෝ විට ඔවුන්ට රැකවරණයෙන් ඉවත්ව යන තරුණ තරුණියන්ට, සේවා නියුක්තියේ නිපුණතා ලබා ගැනීම හෝ ලාභදායී

---

*[10] ශ්‍රී ලංකාවේ නීට් අනුපාතය අඩු කිරීම : සුමට පාසලෙන් වැඩට මාරුවීමේ අවශ්‍යතාවය'. ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (අයිපීඑස්) බ්ලොග් අඩවිය වන 'කතාකරන ආර්ථික විද්‍යාව' 24 ජනවාරි 2019*

*http://www.ips.lk/talkingeconomics/2019/01/24/lowering-sri-lankas-neets-need-for-smoother-school-to-work-transitions/*

*[11] ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ ආයතනවල සහ ආයතනගත දරුවන්ගේ වර්තමාන තත්ත්වය : තත්ත්ව විශ්ලේෂණයක් (2013) පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව*

රැකියා සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ලබා ගැනීම වෙනුවෙන් අවශ්‍ය දිරිගැන්වීම, මඟ පෙන්වීම හෝ සහාය දීම වෙනුවෙන් වූ දැනුම හෝ අවබෝධය නොමැත.

- ශ්‍රම සහභාගීත්වයේ පවත්නා ස්ත්‍රී පුරුෂ අසමානතාවයට දායකවෙමින්, රැකවරණයෙන් ඉවත් වන ගැහැණු ළමයින් කලින් විවාහ වීමට නැඹුරු වීම හෝ විවාහ වූ වහාම රැකියාවෙන් ඉවත් වීම සිදු වේ. සමාජ සහයෝගය සහ ආරක්ෂිත ජාලයන් හිඟකම සැලකිල්ලට ගෙන, ආදරය හා ආරක්ෂාව පිළිබඳ අපේක්ෂාව / පොරොන්දුව සමඟ මෙම තරුණ ගැහැණු ළමයින් විවාහයට පිවිසීමේ (හෝ ආකර්ෂණය කරවීමේ) ප්‍රවණතාවය සහ සම්භාවිතාවය ඉහළ මට්ටමක පවතී. කෙසේ වෙතත්, එවැනි ගැහැණු ළමයින් බොහෝ දෙනෙකුට රැකියා කිරීමේ කුසලතා සහ ආර්ථික සුරක්ෂිතතාව නොමැති විට දී තම විවාහය අසාර්ථක වුවහොත් හෝ ඇය දරුවන් කිහිප දෙනෙකු සමඟ ජීවත්වන තනි මවක් බවට පත්වීමේ අවදානමට ලක්ව සිටියි. අවාසනාවකට මෙන් අසන්නට ලැබෙන සාක්ෂි අනුව එය බොහෝ විට දක්නට ලැබෙන පොදු සිදු වීමකි.

දරිද්‍රතාවය, නොසලකා හැරීම, අතහැර දැමීම හෝ අපයෝජනය පිළිබඳ ළමා අත්දැකීම් හේතුවෙන් විකල්ප රැකවරණය ලබන දරුවන් බොහෝ විට මානසික චිත්තවේගීය ගැටලු සමඟ වැඩෙති. සත්කාර පද්ධතිය තුළ ඔවුන්ගේ අත්දැකීම් මෙම තුවාල සුව කිරීම හෝ ගැඹුරු කිරීම සහ දරුවාගේ හැඟීම හා අනන්‍යතාවය හැඩග ැස්වීම කෙරෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කනගාටුවට කරුණක් නම්, රැකවරණය ලබන බොහෝ ළමුන් සහ යෞවන යෞවනියන් පද්ධතිය තුළදීම දුෂ්කරතාවය හා අයුක්තිය අත්විඳීම යි. ඇතැම් විට ඔවුන්ගේ ආයතනික භාරකරු, පොලිස් / පරිවාස නිලධාරියා හෝ ඇයගේ / ඔහුගේ නඩුව විභාග කරන විනිසුරුවරයා වැනි, ඔවුන්ට වගකිව යුතු අය විසින්ම ඔවුන්ට සලකනු ලබන අනුකම්පා විරහිත හා සංවේදී නොවන ආකාරය නිසා ද එසේ සිදුවේ; ඇතැම් විටක දී පාසැලේ හෝ සමාජයේ දී, ඔවුන්ට විඳ දරාගැනීමට නිරන්තරයෙන් සිදුවන අපකීර්තිය හා වෙනස් කොට සැලකීම නිසා ද එසේ සිදුවේ; එසේ නොමැතිනම් ඔවුන් ළමා රැකවරණය සම්බන්ධ බලධාරීන් අතර පවතින සම්බන්ධීකරණය නොමැතිකම හා අවබෝධය නොමැතිකම වැනි පාලන ගැටළු වල ද ගොදුරු බවට පත්වේ. කිසිදු චිත්තවේගීය සහයෝගයක් නොමැති විට දී සහ ඉහත දක්වා ඇති ගැටළු වලින් සංයුක්ත වූ විට, මෙම ආකාරයේ ඍණාත්මක අත්දැකීම්, දරුවාගේ යහපැවැත්මට අතිශයින්ම අහිතකර විය හැකිය. එවැනි තත්වයන් තුළ, දරුවන් සියලු බලාපොරොත්තු සහ පෙළඹවීම් නැති කර ගැනීමේ ප්‍රවණතාවයක් තිබේ. මෙම අත්දැකීම් රැකවරණයෙන් ඉවත් වී රැකියා ලෝකයට පිවිසීමෙන් පසුව පවා ඔවුන් තුළ හොල්මන් කිරීමට නැඹුරු වන්නේ ඔවුන්ගේ ඉතිහාසය නැවත නැවත සිදුවනු ඇතැයි යන බිය ඇතිකරවමිනි. මෙමගින් රැකවරණය ලබන දරුවන් තුළ මෙන්ම රැකවරණයෙන් ඉවත් වන අය තුළ ද තමා පිළිබඳව මෙන්ම සමාජය පිළිබඳව ද ගැඹුරු විශ්වාසය නොමැතිකමක් හා බොහෝ විට දක්නට ලැබෙන බලරහිතකම පිළිබඳ හැඟීමක් ප්‍රකට කරවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන්ගේ හඳුනාගැනීමට හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් ඉල්ලා සිටීමට ඔවුන්ට නොහැකි අතර, ඔවුන් බොහෝ විට ඒවා පිළිබඳව නොදැනුවත්ව සිටිති. අර්ථවත් විසඳුම් සෙවීම වෙනුවෙන් සේවා නියුක්තිකත්වයේ සහ රැකබලාගැනීමෙන් ඉවත්ව යන තරුණ තරුණියන්ගේ සේවා නියුක්තියේ අභියෝගයට යටින් ඇති ගැඹුරු මානුෂීය ගැටලුවන මේවා ඉස්මතු කොට අවධානයට යොමු කළ යුතුය.

# මගේ අනන්‍යතාවය: මගේ සත්‍යය ද? මගේ නොලැබීමද ?



**මගේ ආත්ම විශ්වාසය මුළුමනින්ම විනාශ වී ඇති බැවින් එසේ කිරීමට මට ආත්ම විශ්වාසයක් නැත. මගේ තත්ත්වයට අධිකරණය, පරිවාසය හා පොලිසිය වගකිව යුතුයි. දැන් මම මා ගැන සහ මගේ පසුබිම ගැන මිනිසුන්ට බොරු කියනවා. ඔව්, මම පන්සලේ දී පවා බොරු කියනවා...”**

“මුල දී මම හැදී වැඩුණේ එක් ළමා නිවාසයක වන අතර පසුව වෙනත් නිවාසයකට මාරු කරනු ලැබුවේ පළමු නිවාසයේ පාලිකාවන් නොමැති වූ නිසා ය. ටික කලකට පසුව මාව නැවතත් මීගමුවේ ක්‍රිස්තියානි නිවාසයකට මාරු කළා. ඉන්පසුව උසාවි නියෝගයක් මත මම මගේ පාසැල් අධ්‍යාපනය ආරම්භ කළා. මට උප්පැන්න සහතිකයක් හෝ ජාතික හැඳුනුම්පතක් (NIC) තිබුණේ නැහැ. මට තිබුණේ එක නමක් විතරයි, මට වාසගමක් තිබුණේ නැහැ. මා එවකට සාමාන්‍ය පෙළ පන්තියේ සිටි අතර විභාගයට පෙනී සිටීමට මහත් උනන්දුවෙන් බලා සිටියා. දවසක් විදුහල්පතිතුමා ඇවිත් මගේ දෙමාපියන්ගේ නම් ඇහුවා. මම පිළිතුරු දුන්නේ මට කිසිවෙකු නොමැති බවයි. “එහෙනම් ඔයා දෙමව්පියන් නැතිව මේ ආකාරයට හැදී වැඩුණේ කොහොම ද?” විදුහල්පති තුමා ඇහුවා. මම පාසල් අධ්‍යාපනය නැවැත්වූ දිනය එය යි. මහේස්ත්‍රාත්වරිය මගෙන් ප්‍රශ්න කළ විට, සිදු වූ දේ ගැන මම පැහැදිලි කළා, මම නැවතත් කිසි දිනෙක පාසැලට නොයන බවත් ඉගෙන ගැනීමට වෙනත් ස්ථානයක් සොයාදෙන ලෙසත් මා ඉල්ලා සිටියා. පසුව මාව යොවුන් බලකායට යැව්වා, එහි දී මම සතුටින් එක් පාඨමාලාවක් සම්පූර්ණ කළා. අවසානයේ දී, මම NVQ 1 මට්ටමේ විභාගයට සූදානම් වන විට නැවතත් මගේ අනන්‍යතා ප්‍රශ්නය මතු වුණා. එක් කථිකාචාර්යවරයෙක් ‘වාසගම නොමැති කෙනෙකු’ ගැන විමසුවා. ඒ වෙන කවුරුත් නොවේ. ඒ මම යි. කෙසේ වෙතත්, මම විභාගය සඳහා පෙනී සිටියා නමුත් මට ජාතික හැඳුනුම්පතක් නැති නිසා සහතිකයක් ලබා දුන්නේ නැහැ. එය මගේ වරදක්ද? මගේ දුක්ගැනවිලි පරිවාස නිලධාරීන්ට, පාලකවරුන්ට සහ අපව අධිකරණයට සහ පිටතට ගෙන යන බන්ධනාගාර බස් රථයේ රාජකාරියේ යෙදී සිටි පුද්ගලයින්ට පවා ඉදිරිපත් කළා. මට ඇහුම්කන් දීමට කිසිවෙකුට අවශ්‍ය වුනේ නැහැ. ඒ වන විට සියල්ලම එපා වී මගේ ජීවිතයෙන් වෙහෙසට පත්ව සිටියා. මම හෙදියක් වීමට ආශා කළා, එය මගේ සිහිනය වුණා, ඒ වගේම හෙදියක් වීමට අවශ්‍ය සියලු ගුණාංග මට තිබුණා. මට සාමාන්‍ය පෙළ සුදුසුකම් නොමැති නිසා මට කළ හැකි වූයේ රැකවරණය පිළිබඳ පාඨමාලාවක් විතරයි. මම කොළඹ පිළිගත් රෝහලක හෙද රැකියාවක් සඳහා ඉල්ලුම් කළා. මම ඔවුන්ට කිව්වා මම සාමාන්‍ය පෙළ සමත් වුණේ නැහැ කියලා. ඔවුන්ට තවමත් අවශ්‍ය වූයේ මා දක්ෂ බැවින් මාව බඳවා ගැනීමට යි මට ජාතික හැඳුනුම්පතක් නොමැති නිසා මට එම අවස්ථාව ද අහිමි වුණා. 2015 දී මම වෙනත් ළමා නිවාසයකට ආවා, මම තවමත් එහි නැවතී ඉන්නවා. අනුමාන වයස් සහතිකයක් සහ ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීමට ඔවුන් මට සහාය දුන් නිසා නැවතත් මම ජීවත්වන බව එහි දී මට අවසානයේ දී දැණුනා. මේ වන විට මම රූපලාවණ්‍ය පාඨමාලාවක් හදාරණවා. සම්මුඛ සාකච්ඡාවේ දී අනුමාන වයස් සහතිකයක් කිසිදිනක දැකනැති රූපලාවණ්‍යාගාරයේ හිමිකරු “මේ මොන පුදුම සහතිකයක්ද” කියා මගෙන් ඇසුවා. පාඨමාලාව හදාරන අතරතුර දී මම දැනට නවාතැන් ගෙන සිටින ළමා නිවාසයේ පෝෂණ මධ්‍යස්ථානයේ සේවය කරනවා. මට වෙනත් රැකියාවක් ලබා ගැනීමට අවශ්‍ය වුවද මගේ ළමා කාලය තුළ මගේ ආත්ම විශ්වාසය මුළුමනින්ම විනාශ වී ඇති බැවින් එසේ කිරීමට මට ආත්ම විශ්වාසයක් නැත. මගේ තත්වයට අධිකරණය, පරිවාසය හා පොලිසිය වගකිව යුතුයි. දැන් මම මා ගැන සහ මගේ පසුබිම ගැන මිනිසුන්ට බොරු කියනවා. ඔව්, මම පන්සලේ දී පවා බොරු කියනවා...”

- අනූෂා [12] රැකවරණය හැර ගිය යෞවනියක් (වයස අවුරුදු 24)

---

[12] *මෙම නම යෞවනියගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම පිණිස යොදාගත් ආරූඪ නමකි.*

## 4. වර්තමාන නීතිමය සහ ප්‍රතිපත්තිමය සන්දර්භය

ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ ආයතනවල තරුණ තරුණියන් වයස අවුරුදු 18 ට ළඟා වූ පසු, ඔවුන්ගේ රැකවරණ නිවාසයෙන් වෙන් වී වැඩිහිටියෙකු ලෙස ස්වාධීනව ජීවත්වන ලෙස රටේ නීතියෙන් නියම කර තිබේ. නමුත් 1941 අංක 22 දරණ අනාථ නිවාස ආඥාපනත (1946 අංක 45 මගින් සංශෝධනය කරන ලද පරිදි), 1939 අංක 48 දරණ ළමා හා බාල යෞවනයින් පිළිබඳ ආඥා පනත යන දෙකම සහ 1907 අංක 5 දරණ නිවර්තන නිවාස ආඥා පනත (1955 අංක 26 දරණ පනත මගින් සංශෝධනය කරන ලද පරිදි) මගින් අවදානමට ලක්විය හැකි ළමුන් සහ තරුණ තරුණියන් සඳහා මෙම එක් එක් පනත් මගින් තීරණය කරනු ලබන නියමිත වයස් සීමාවෙන් ඔබ්බට යන තෙක් නීතිමය ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ස්වාධීනත්වය වෙතට මාරුවීම සඳහා හෝ රැකවරණයෙන් ඉවත්ව යන තරුණ තරුණියන් රැකබලා ගැනීම සඳහා ඊට අනුරූප නීතිමය රාමුවක් නැත. සියළුම ස්වේච්ඡා ළමා රැකවරණ ආයතන පාලනය කරන අනාථ නිවාස ආඥා පනතේ 15 (ආ) වගන්තිය මඟින් ඍදඹවුන්% "වයස අවුරුදු දහ අට දක්වා ළඟාවන තෙක" ළමයින් ආරක්ෂා කිරීම සීමා කරවනු ලැබේ. එබැවින් ළමා රැකවරණ ආයතනවලට සහ රාජ්‍ය නිලධාරීන්ට වයස අවුරුදු දහ අටේ ළමයින් නීතියේ අවශ්‍යතාවය මත ඉවත් කිරීමට බල කෙරී තිබේ. 'අනාථ දරුවන් සහ අතහැර දමන ලද දරුවන් ළමා නිවාසයේ දී නවාතැන් හා නඩත්තු කිරීම සඳහා ඇතුළත් කර ගත හැකි තත්ත්වයන් සහ ඒවායින් ඔවුන් මුදා හැරීම' (අවධාරණය එකතු කරන ලදි) පිළිබඳ ආඥා පනත මගින් සහතිකකර සලකා බැලුව ද, රැකවරණය අත්හරින අයගේ යහපැවැත්ම හෝ සංක්‍රමණය සඳහා ඵලදායී පදනමක් නොමැති බව පෙනේ. [13]

තවද, රජයේ සහතිකකල පාසල්, අනුමත පාසල් සහ රැඳවුම් නිවාස පාලනය කරන ළමා හා තරුණ පුද්ගලයින්ගේ ආඥා පනතේ 88 වන වගන්තිය මඟින් 'දරුවෙකු' අවුරුදු 14 ට අඩු පුද්ගලයෙකු ලෙසත්, 'තරුණයා' වයස අවුරුදු 14 ත් 16 ත් අතර පුද්ගලයෙකු ලෙස අර්ථ දක්වයි. නමුත් නීතියට පටහැනි වූ ළමයින්ට සහ වයස අවුරුදු 12 ත් 16 ත් අතර වූ රැකවරණය හා ආරක්ෂාව අවශ්‍යවන ළමයින්ට අවුරුදු 3 ක කාලයක් සඳහා සහතිකකල පාසල්වල නවාතැන් ගත හැකි බව එහි සඳහන් වුව ද, වසර 3 ක පුනරුත්ථාපන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට පසුව  මෙම දරුවන් සමාජගත කිරීමේ මාධ්‍යයන් පිළිබඳව එම ආඥා පනතේ සඳහන් නොවේ. වයස අවුරුදු 5 ත් 15 ත් අතර අනාථ, අතහැර දමා අසරණ වූ දරුවන් (පිරිමි ළමුන් හා ගැහැණු ළමයින්) රඳවා ගැනීම හා පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් නිවර්තන නිවාස පනත මගින් පාලනය වන රජයේ රැඳවුම් නිවාසය පිහිටුවන ලද නමුත් නැවත වරක් මෙම දරුවන්ගේ සංක්‍රාන්තිය හෝ පශ්චාත් රැකවරණය සඳහා නීතියෙන් විධිවිධාන සැලසෙන්නේ නැත. [14]

වයස අවුරුදු 18 දී හෝ ඊට පෙර රැකවරණයෙන් ඉවත් වීමට නීතියෙන් බල කිරීම නිසා මෙම තරුණ තරුණියන් වෙනත් විකල්පයක් නොමැති හෙයින් නීති විරෝධී, අවිනීත හා අවදානම් සහගත රැකියාවල නිරත වීමේ අවදානමක් තිබේ. ඔවුන් සූරාකෑමට ලක්වීමට ද වැඩි අවදානමක් තිබේ. ඒ බොහෝ විට මෙම තරුණ පිරිසට නොලැබෙන වැඩිහිටි මග පෙන්වීම සහ සහාය නොමැතිව සුදුසු රැකියාවක් ලබා ගැනීම සඳහා ඔවුන් බොහෝ විට ප්‍රමාණවත් නිපුණතා, සුදුසුකම් හෝ පළපුරුද්දක් නොමැති වීම හේතුවෙනි. ඔවුන්ට කම්කරු නීති පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හෝ ඒ සඳහා ආරක්ෂිත දැලක් හෝ නොමැත. අවුරුදු 18 දී රැකවරණයෙන් ඉවත්වීමෙන් පසුව වහාම හෝ ඉක්මණින් නවාතැන් පහසුකම් නොලැබීම යනු නවාතැනක් සොයා ගැනීම වෙනුවෙන් මෙම තරුණයින්ට තම සුදුසුකම නොසලකා ලැබෙන ජීවනෝපාය පිළිගැනීමට පොළඹවන තවත් ප්‍රධාන සාධකයකි. එතරම් තරුණ වියේ දී තත්වයන්ට අනුවර්තනය වීමට බල කිරීම සහ එමඟින් තම සංවර්ධනයට වඩා තම පැවැත්මට ප්‍රමුඛතාවය දීම යනුවෙන් අදහස් කරන්නේ යහපත් හා වඩා තෘප්තිමත් රැකියාවක් සඳහා ප්‍රවේශ වීමට සහාය වන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා තව තවත් අවස්ථාවන් අහිමි වීමේ වැඩි සම්භාවිතාවක් තිබෙන බවයි.

රැකවරණයෙන් ඉවත් වී යන තරුණ තරුණියන්ගේ සේවා නියුක්තිකත්වය හා සේවා නියුක්තිය පිළිබඳ එකම සඳහන ජාතික විකල්ප රැකවරන ප්‍රතිපත්තියේ (2019) සහ ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ ආයතන සඳහා වන NCPA (කෙටුම්පත්) මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් (2013) හි දක්වා තිබේ.

ජාතික විකල්ප රැකවරන ප්‍රතිපත්තිය තුළ වැදගත් වන්නේ යැයි සැලකෙන්නේ,

18 හැවිරිදි ළමයින් රැකවරණ සැකස්මකින් ඉවත්වීමට සූදානම් කිරීමේ දී පසු රැකවරණ සැළැස්මක් සහිතව සහ අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව, රැකියා ස්ථානගත කිරීම, නිවාස හා මනෝ සමාජීය, නෛතික හා සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සහ ආබාධිත පුද්ගලයින් සහ විශේෂ අවශ්‍යතා සඳහා විශේෂ සේවාවන් සමඟ ඒකාබද්ධ කිරීමේ දී සුදුසු මූල්‍ය හා චිත්තවේගීය සහාය ඇතුළු අමතර සහාය සඳහා.රැකවරණය සැකසීමට සූදානම්ව සිටින රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල සම වයසේ මිතුරන්, රැකබලා ගන්නන් සහ සේවා සපයන්නන්ගේ ජාලයකට ප්‍රවේශ වීම සහතික කරයි. (6.5.12 වගන්තිය.)

කෙසේ වෙතත්, ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ සැලැස්මක් තවම සංවර්ධනය කර නොමැත.

3.17 වගන්තිය යටතේ. (කෙටුම්පත) එන්.සී.පී.ඒ මාර්ගෝපදේශවල ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම සහ රැකවරණය අත්හැරීම් තුළ ළමයින් රැකවරණ ආයතනවලින් ඉවත් වන විට ඔවුන්ට අධ්‍යාපනය හා ඵලදායී රැකියා සඳහා අවස්ථා ලබා දිය යුතු බව සඳහන් වේ; රැකවරණය අත්හරින්නන්ට නවාතැන් හා රැකියාවන් සඳහා සහාය වන ලෙස ආයතන කළමනාකරණ කමිටුවට උපදෙස් දෙයි; රැකවරණය අත්හරින්නන්ට අදාළ ලියකියවිලි සැපයීම සඳහා ළමා රැකවරණ ආයතනවල වගකීමක් ලෙස නියම කරයි, උදා. උප්පැන්න සහතිකය, වෛද්‍ය වාර්තා, අධ්‍යාපන සම්බන්ධ සහතික; පහසුකම අත්හැරීම සම්බන්ධයෙන් දරුවාට අවශ්‍ය මග පෙන්වීම සහ සහාය ලබා දිය යුතු බව නියම කරයි;

[13] ප්‍රතිපත්ති කෙටියෙන් **18+** : *රැකවරණය හැරයන තරුණයින් සඳහා ආධාරක පද්ධති ගොඩනැගීම (2017).* **SOS** *ළමා ගම්මානය*

[14] ප්‍රතිපත්ති කෙටියෙන් **18+** : *රැකවරණය හැරයන තරුණයින් සඳහා ආධාරක පද්ධති ගොඩනැගීම (2017).* **SOS** *ළමා ගම්මානය*

දෙමව්පියන් හෝ ඥාතීන් නොමැතිව රැකවරණයෙන් ඉවත්ව යන අයගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා විධිවිධාන සැලසීම සහ දරුවා රැකවරණ ආයතනයෙන් ඉවත් වී අවම වශයෙන් වසර 1 ක් ගතවන තුරු පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතු යැයි උපදෙස් ලබා දෙයි. කෙසේ වෙතත්, මෙම මාර්ගෝපදේශ තවමත් කෙටුම්පත් ස්වරූපයෙන් පවතින අතර ඒවා ළමා රැකවරණ ආයතන හෝ අදාළ රජයේ නිලධාරීන් විසින් හොඳින් දැනුවත්ව නැත, ඔවුන් වෙත යොමු කරන ලදුව හෝ ඔවුන් විසින් පිළිපැද නොමැත. තව ද, ගැටලුවට පිළියමක් වශයෙන් සම්පත් ද ඇතුළුව හොඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ක්‍රියාමාර්ග නොමැති වූ විට මාර්ගෝපදේශ පමණක් ප්‍රමාණවත් නොවේ. නිසි උප්පැන්න සහතිකයක් නොමැතිකම හේතුවෙන් රැකවරණය අත්හරින්නන් මුහුණ දෙන ගැටළු පිළිබඳව 2017-2019 කාලය තුළ කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුව දීර්ඝ වශයෙන් විවාදයට ලක් කළේ ය. රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව සහ ජාතික පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (DPCCS) ඇතුළු බහු පාර්ශවකරුවන්ගේ බොහෝ සාකච්ඡා හා අදහස් විමසීමෙන් පසුව, 2018 අගෝස්තු මාසයේදී කමිටුව විසින් යෝජනා කරන ලද්දේ දෛනික ගනුදෙනු සඳහා දරුවාගේ නම, ස්ත්‍රී පුරුෂ භාවය, උපන් දිනය සහ මවගේ නම පමණක් සහිත උප්පැන්න සහතිකයේ 'උපුටා ගැනීමක්' නිකුත් කිරීම යි. දිගු අනුවාදය ඉල්ලීම අනුව ලබා දීමට යෝජනා කරන ලදී. රැකවරණය තුළ සිටින සහ රැකවරණය අතහැර යන දරුවන්ගේ අභිමානය ආරක්ෂා කිරීම සහ වෙනස් කොට සැලකීම හා අපකීර්තිය වැළැක්වීම මෙයින් අපේක්ෂා කරන ලදී. සියලුම අලුත උපන් බිළිඳුන් සඳහා මෙම වෙනස්කම් 2019 සිට ක්‍රියාත්මක කිරීමට සලකා බලන ලදී. කෙසේ වෙතත්, සමහර රාජ්‍ය අධිකාරීන්ගේ විරෝධතා හේතුවෙන් 2019 මැද භාගයේ දී යළිත් වරක් අවිනිශ්චිතතාවයන් ඇති වීම ආරම්භ විය. ශ්‍රී ලංකාවේ කිසිදා අත්නොහරින පරපුර ජාලය ය (Generation Never Give UP Network) ජාලය ඇතුළු වෙනස්කම් යෝජනා කරන්නන් විසින් සිදු කරන ලද අභියාචනාවන් සැලකිල්ලට ගනිමින් කමිටුව නැවත වරක් විසඳුමක් සෙවීමේ උත්සාහයන් අනුගමනය කිරීම වෙනුවෙන් එකඟ වී තිබේ. තවද, කමිටුවේ කාර්යයේ ප්‍රතිඵලයක් ලෙස උප්පැන්න සහතිකයේ ඇති විවාහක අවිවාහක තීරුව ඉවත් කිරීමෙන් රජය ප්‍රගතිශීලී පියවරක් ගෙන තිබේ.

මීට අමතරව, ඍජකී මෑතකදී ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සහයෝගයෙන් ප්‍රගතිශීලී පියවරක් ගෙන ඇති අතර, රජය විසින් පවත්වාගෙන යනු ලබන ළමා රැකවරණ ආයතන කිහිපයක එනම් සහතික කළ පාසල්වල දී ළමුන් හා තරුණයින් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික කළ පාඨමාලා පිරිනැමේ. මෙම මූලාරම්භය රජයේ මූල්‍ය සහයෝගය ඇතිව අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

සමස්තයක් ලෙස ගත් කල, ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන්ම කුසලතා සහ රැකියා ප්‍රවර්ධනය කරන ජාතික නීති, ප්‍රතිපත්ති සහ වැඩසටහන් රාශියක් තුළ රැකවරණය අත්හරින්නන් අදෘශ්‍යමාන වේ.

# 5. යෞවන යෞවනියන්ගේ සේවා නියුක්තිය ශක්තිමත් කිරීම සඳහා SOS ළමා ගම්මාන ආයතනයේ උත්සාහයන්

## 5.1. ආයතනික දළ විශ්ලේෂණය

SOS ළමා ගම්මාන ආයතනය දෙමාපියන්ගේ රැකවරණය අහිමි වූ හෝ එය අහිමි වීමේ අවදානමට ලක්ව සිටින දරුවන් ආරක්ෂා කිරීම සහ රැකබලා ගැනීම කෙරෙහි අවධානය යොමුකරන ලෝකයේ විශාලතම රාජ්‍ය නොවන සංවිධානය වේ. දරුවන් ආදරණීය පවුල් පරිසරයක හැදී වැඩෙන බවට සහ සෑම සමාජයකම සියලු දරුවන්ගේ අයිතිවාසිකම් සපුරාලනු ලැබීම සහතික කිරීම සඳහා රටවල් 136 ක ප්‍රජාවන්, හවුල්කරුවන් සහ රාජ්‍යයන් සමඟ අප ක්‍රියාත්මක වන්නෙමු. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989), විකල්ප ළමා රැකවරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ (2009) අනුව එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායක වෙමින්, අප ක්‍රියාත්මක වන්නෙමු. ඇස්තමේන්තුගත පරිදි ලෝකයේ ළමුන් මිලියන 220 ක් පමණ ප්‍රමාණයක් දෙමාපිය රැකවරණය නොමැතිව හැදී වැඩෙමින් සිටී. 1949 වර්ෂයේ සිට ඔවුන්ට උපකාරවීම වෙනුවෙන් පරිපූර්ණ සහාය සහ උසස් තත්ත්වයේ සේවාවන් අප විසින් සපයන්නෙමු. ළමා ගම්මාන හරහා ලබා දෙන පවුලක් වැනි රැකවරණ කවරණ (Family - Like Care) සහ ඥාති රැකවරණ (Kinship Care)

සහ කැපකරු මාපිය රැකවරණ (Foster Care) තුළින් ලබා දෙන පවුල් පාදක රැකවරණ (Family – Based Care) ඇතුළු ගුණාත්මක විකල්ප රැ කවරණ ගණනාවක් හරහා අපි දරුවන්ට ආදරණීය නිවසක් ලබා දෙන්නෙමු; අතහැර දැමීමට හා සමාජ නොසලකා හැරීමට එරෙහි සටනේ වැළැක්වීමේ පියවරක් ලෙස පවුල් සහ ප්‍රජාවන් ශක්තිමත් කිරීම සිදු කරන්නෙමු; දෙමව්පියන්ගේ රැකවරණය අහිමි වූ හෝ අහිමිවීමේ අවදානමක් සහිත දරුවන් කෙරෙහි ඔවුන්ගේ කැපවීම් ඉටු කිරීමට රජයන් සහ ප්‍රජාවන් සමඟ උද්දේශනය සැපයීම සිදුකරන්නෙමු; එසේම

හදිසි අවස්ථාවන්වල දී සපයන රැකවරණය දරුවන් ආරක්ෂා කිරීම සිදුකරන්නෙමු. පසුගිය අවුරුදු 70 තුළ දී, SOS ළමා ගම්මාන විසින් විකල්ප රැකවරණය සහ පවුල් ශක්තිමත් කිරීම හරහා ගෝලීය වශයෙන් ළමුන් මිලියන 4 කට පමණ සහයෝගය ලබා දී තිබේ. ශ්‍රී ලංකාවේ 1981 දී පිහිටුවන ලද දා සිට ළමුන්, තරුණයින් සහ පවුල් 41,000 කට අධික සංඛ්‍යාවක් විසින් ශ්‍රී ලංකා SOS ළමා ගම්මාන මගින් සපයනු ලබන සේවාවන්ගෙන් ප්‍රතිලාභ ලබාගෙන තිබේ. පවුලක් වැනි රැකවරණය, හදිසි අවස්ථාවන්වල දී සපයන රැකවරණය තාවකාලික රැකවරණය, පවුල් ශක්තිමත් කිරීම, තරුණයින් සඳහා වෘත්තීය පුහුණුව සහ පෙර පාසල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන වැනි උපකාරක සේවාවන් ලබා දීම ආදී රාශියක් මෙයට ඇතුළත් වේ.

## 5.2. තරුණ සේවා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් SOS ප්‍රවේශය

වයස අවුරුදු 15 ට වැඩි වැඩසටහන් සහභාගිවන්නන්ගේ ගෝලීය ප්‍රවණතා සහ එහි වැඩිවන ජනගහනයේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, SOS ළමා ගම්මාන ආයතනය යෝග්‍ය රැකියා සහ ආර්ථික වර්ධනය පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්කයට අනුකූලව තරුණ සවිබල ගැන්වීම වෙනුවෙන් උපායමාර්ගික මුලපිරීමක් සකස්කර තිබේ.

අධ්‍යාපනය, නිවාස හා සේවා නියුක්තිය යන කරුණු සලකා බලන සමස්ත තරුණ වැඩසටහනක් තුළ තරුණ සේවා නියුක්තිකත්වය පදනම් වී තිබේ. රැකවරණයෙන් ඉවත්ව යෝග්‍ය රැකියාවක් සොයා ගැනීම සඳහා සූදානම් වීම තරුණයාගේ රැකවරණ ඉතිහාසයේ මුල් අවධියේ සිට ආරම්භ වේ. අනාගත අරමුණු සහිත, පරිපූර්ණ හා සහභාගීත්වයෙන් යුත් ළමා හා තරුණ සංවර්ධන සැලසුම් ක්‍රියාවලියක දී, තරුණ ගැහැණු ළමයින් සහ විශේෂ අවශ්‍යතා සහිත තරුණ තරුණියන්  සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පුද්ගල හැකියාවන්, කුසලතා, අවශ්‍යතා සහ අභිරුචියන් හඳුනාගෙන සංවර්ධනය කරනු ලැබේ. තරුණ සේවා නියුක්තිය වෙනස් කිරීමේ න්‍යායක් මගින් ප්‍රධාන මැදිහත්වීම් සඳහා මෙන්ම අපේක්ෂිත ප්‍රතිඵල සහ තරුණ සේවා නියුක්ති ක්ෂේත්‍රයේ බලපෑම වෙනුවෙන් රාමුවක් සකසයි.

තරුණ සේවා නියුක්තිය සඳහා SOS ගෝලීය රාමුව තුළ කුළුණු 3 ක් තිබේ:

- **උපදේශකයා: යෞවන යෞවනියන් වෙනුවෙන් ආදර්ශ භූමිකාවන් සඳහා ප්‍රවේශය ලබා දීම.**
- **පුහුණුව: මෘදු හා රැකියා කුසලතා පිළිබඳ අධ්‍යාපන පරතරය පිරවීම.**
- **භාවිතය: යෞවනයන් රැකියා ලෝකයට සම්බන්ධ කිරීම.**

අපගේ ඉලක්කය සපුරා ගැනීමට උපකාරී වන සාධක අතර සාමාජික සංගම් තුළ තරුණ සේවා නියුක්තිය; හවුල්කාරිත්වයන්; තොරතුරු තාක්ෂණය තුළින් නව්‍යකරණය ආදිය කෙරෙහි දැඩි අවධානයක් යොමු වේ.

ශ්‍රී ලංකාවේ" SOS ළමා ගම්මාන ආයතනය අනුරාධපුර, මල්පොත, මොණරාගල සහ යාපනය යන ස්ථානවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 4 ක් පවත්වාගෙන යන අතර, අවදානම් සහිත ප්‍රජාවන් හි තරුණ තරුණියන්ට" SOS තරුණ තරුණියන්ට මෙන්ම ළමා ආරක්ෂණ ආයතනවලින් ඉවත්ව යන අයට ද නොමිලේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ පාඨමාලා පවත්වයි. වර්තමානයේ දී එහි ඉහළ සාර්ථකත්ව අනුපාතයක් පවතින අතර, පුහුණුව අවසන් වූ පසු තරුණයින්ගෙන් 98 කට රැකියා ලැබී තිබෙන අතර ඔවුන්ගෙන් 100% කට මාසික වැටුප රු. 30,000 හෝ ඊට වැඩි ප්‍රමාණයක් වේ.

සියළුම SOS වැඩසටහන් වල පරමාර්ථය වන්නේ තරුණ තරුණියන්ට තම ස්වයං යැපීමෙන් කටයුතු කිරීමට අවස්ථාව ලබා දීම සහ ඔවුන්ගේ සමාජවල දායක සාමාජිකයින් වීමට අවස්ථාව ලබා දීම යි.  YouthCan! යෞවන යෞවනියන්ගේ සේවා නියුක්තිය ශක්තිමත් කිරීම සඳහා ආයතනික සහ සහායක හවුල්කරුවන් සමඟ වැඩ කරමින් මෙම ඉලක්කය කරා යෑමට උත්සාහ  දරයි. කෙසේ වෙතත්, වැඩසටහනේ තිරසාර බලපෑමක් ඇති කර ගත හැක්කේ තරුණ වැඩසටහන් වලට සහභාගීවන්නන්ට පුද්ගල සහය ලබා දීමෙන් හා පසු විපරම් සිදු කිරීමෙන් පමණි. මෙය සිදු කරනු ලබන්නේ නිත්‍ය පුද්ගල සංවර්ධන සැලසුම් සැසිවල දී SOS තරුණ සත්කාර වෘත්තිකයන් හරහා ය.

කුඩා කල සිටම ස්වයං යැපීම කරා යන ගමනේ දී ළමයින්ට සහ තරුණයින්ට පූර්ණ සහය ලබා දීම සඳහා වන SOS ළමා ගම්මාන මෙහෙයුමට මෙම යූත් කැන්! වැඩසටහන ඇතුළත් වේ. එය **2030 උපායමාර්ගයේ උපායමාර්ගික මුලපිරීම්** ("යෞවන යෞවනියන් සවිබල ගැන්වීම") හා **SOS රැකවරණ පොරොන්දුවේ** ඇති කැපවීම් සමඟ සම්බන්ධ වී තිබේ. [15] ("අපි අධ්‍යාපනය, සහභාගීත්වය සහ ස්වාධීන ජීවිතය සඳහා තබන පියවරයන් ප්‍රවර්ධනය කරන්නෙමු" සහ "අපි සහාය සේවා සහ ගුණාත්මක සත්කාර සඳහා හවුල් වන්නෙමු"). අවසාන වශයෙන්, YouthCan!  තිරසාර සංවර්ධන ඉලක්ක 1, 4, 8, 10 සහ 17 සඳහා දායක වේ.

*[15] SOS රැකවරණ පොරොන්දු යනු අපගේ කාර්යයේ අඩිතාලම වන මූලධර්ම හා සාරධර්ම, අපගේ මෙහෙවර ක්‍රියාත්මක කරන සත්කාර විසඳුම් සහ ගුණාත්මක සත්කාර සඳහා අපගේ කැපවීම් තුළින් අප කරන දේ සහ අප එය කරන්නේ කෙසේද යන්න යන දෙකම ප්‍රකාශ කරන ප්‍රතිපත්තියකි.*




YouthCan! වැඩසටහන් මූලධර්ම 5 කින් මෙහෙයවනු ලැබේ:

1. YouthCan! බහු-මාන ප්‍රවේශයක් ඉදිරිපත් කරයි
2. YouthCan! ආරක්ෂිත සහ ශක්තිමත් සබඳතා ගොඩනංවයි
3. YouthCan! පුද්ගල විසඳුම් ඉදිරිපත් කරයි
4. YouthCan! අයිතිය දේශීය වේ
5. YouthCan! තිරසාර හවුල්කාරිත්වයක් ගොඩනංවයි

ශ්‍රී ලංකාවේ, YouthCan! මුල පිරීම 2018 දී SOS ළමා ගම්මාන සහ SOS පවුල් ශක්තිමත් කිරීමේ වැඩසටහනේ තරුණ තරුණියන්ට විවිධ පුහුණු අවස්ථා ලබා දුන් සාර්ථක ආයතනික හවුල්කාරිත්වයන් කිහිපයකින් සමන්විත වේ:

1. DPDHL හි හවුල්කාරිත්වය යටතේ රැකියා දිශානතිය, සමාජ කුසලතා, පුද්ගලික පරිණතභාවය සහ රැකියා සොයා යෑමේ කුසලතා පිළිබඳ දින 4 ක පුහුණු මාලාවක් පවත්වන ලදී.
2. ගලදාරි හෝටලයේ ආහාර පාන අංශය විසින් තරුණයින්ට වසරක පුහුණුවක් ලබා දෙන ලදී.
3. සීමාවාසික පුහුණුවීම් 5 ක් සෙලාන් බැංකුව විසින් පිරිනමන ලදී.
4. McQuire Rens & Jones විසින් මෙහෙයවන ලද නායකත්ව පුහුණු වැඩසටහන.
5. ආගන්තුක සත්කාරය පිළිබඳ මාස 6 ක කාර්මික පුහුණුව හෝටල් ටජ් සමුද්‍රා සහ හිල්ටන් කොළඹ රෙසිඩන්සි විසින් ලබා දෙන ලදී.
6. හර්බට් ස්ටෙෆාන් (Herbert Stephan) විසින් SOS තරුණ තරුණියන්ට සීමාවාසික පුහුණුව ලබා දී තිබේ.
7. YouthCan! හි සහකාර හවුල්කරුවෙකු වන යෞවන වෘත්තීය මුලපිරීම (YCI) මගින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ හෝටල්වල පුහුණු අවස්ථා ලබා දී තිබේ.

වයස අවුරුදු 15-25 අතර තරුණ තරුණියන් 156 ක් (කාන්තා 94 ක් සහ පිරිමි 62 ක්) 2018 අවසන් වන විට මෙම වැඩසටහනෙන් ප්‍රතිලාභ ලබා තිබේ. නුවරඑළිය අනාගතයේ දී ළමා රැකවරණ ආයතනවලින් ඉවත්ව යන අය සඳහා ද මෙම අවස්ථා පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ.

# 6. නිර්දේශ

"රැකවරණයෙන් ඉවත්ව යන තරුණ තරුණියන්ට මූල්‍යමය වශයෙන් ස්වාධීන වීමට සහ ඔවුන්ගේම වූ ආදායමක් උපයා ගැනීමට උපකාර කිරීම සඳහා දැනට පවත්නා අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අවස්ථා ජීවන කුසලතා අධ්‍යාපනයේ කොටසක් ලෙස ලබා දිය යුතුය." - ළමුන්ගේ විකල්ප රැකවරණ සඳහා එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ 2009 (135 වන වගන්තිය)

පහත දැක්වෙන්නේ විකල්ප රැකවරණයෙන් සමුගන්නා යෞවනයන්ගේ සේවා නියුක්තිය ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන වගකීම් දරන්නන් වෙත කරන ලද නිර්දේශයන් වන අතර එමගින් මෙම පාර්ශවකරුවන් සහ යෞවන යෞවනියන් අතර ඇති පරතරය අඩු කරයි. 2019 අගෝස්තු මාසයේදී SOS ළමා ගම්මාන ආයතනය හි පවත්වන ලද SOS සහ තවත් ළමා රැකවරණ ආයතන කිහිපයකින් සමුගත් යෞවනියන් (Generation Never Give Up) සමග පැවති සාකච්ඡාවකදී කරන ලද නිර්දේශ මෙයට ඇතුළත් වේ.

## 6.1 ප්‍රතිපත්ති සම්පාදකයින් වෙනුවෙන් වූ නිර්දේශයන්

පහත නිර්දේශිත නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ වෙත අවධානය ලබා දෙන ලෙස අපි රජයෙන්, විශේෂයෙන් පහත බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නෙමු:

- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
  - පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව (DPCCS)
  - ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය National Child Protection Authority (NCPA)
- නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
  - පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව(NAITA)
  - වෘත්තීය පුහුණු අධිකාරිය (VTA)
- තරුණ කටයුතු අමාත්‍යාංශය
- අධ්‍යාපන අමාත්‍යාංශය
- අධිකරණ අමාත්‍යාංශය
- මුදල් හා සැලසුම් අමාත්‍යාංශය
- රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව

1. රැකවරණයෙන් ඉවත් වී යන යෞවනියන්ට නීත්‍යානුකූලව හිමිකම් ලැබිය යුතු අත්‍යවශ්‍ය සේවා භාවිතා කිරීම සඳහා අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ලියකියවිලි (ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, වෛද්‍ය වාර්තා ආදිය) හිමිවීම වෙනුවෙන් රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි බලාත්මක කළ යුතුය. උප්පැන්න සහතිකය සම්බන්ධයෙන්, ස* නිශ්චිත අරමුණු සඳහා ඉල්ලීම මත දීර්ඝ අනුවාදය ලබා ගැනීමේ විකල්පය ද සමඟ දෛනික ගනුදෙනු සඳහා සියළුම පුරවැසියන්ට නම, ස්ත්‍රී පුරුෂ භාවය, දිනය සහ උපන් ස්ථානය සහ මවගේ නම පමණක් සහිත උපුටනයක් නිකුත් කළ යුතුය; සස* දෙමව්පියන්ගේ තොරතුරු නොදන්නා හෝ කිසිසේත් සොයාගත නොහැකි දරුවන් සඳහා අනුමාන වයස් සහතිකයක් නිකුත් කළ යුතුය. කෙසේ වෙතත් මෙම සහතිකයේ ආකෘතිය උපන්දිනය (උදා: ජනවාරි 1 / ජූලි 1) සහ හිස් ඉඩ නොමැතිව වඩාත් වෘත්තීය, බලයලත් පෙනුමක් ලබා දීම වෙනුවෙන් වෙනස් කළ යුතුය; සසස* රජයේ නිලධාරීන්, සේවා සපයන්නන්, පුද්ගලික ආයතන සහ සාමාන්‍ය ජනතාව ඇතුළු සියලුම පාර්ශවකරුවන් අතර මෙම නීතිමය වලංගුභාවය පිළිබඳව ද ඇතුළත්ව මෙම ලේඛන පිළිබඳ තොරතුරු පුළුල් ලෙස බෙදා හැරිය යුතුය .

*SOS Care Promise is the policy that articulates both what we do and how we do it via the principles and values that form the foundation of our work, the care solutions through which we implement our mission, and our commitments to quality care.*

2. විකල්ප රැකවරණ ආයතන ද ඇතුළුව අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන, සේවා යෝජකයින් සහ තරුණයින් අතර සමීප සම්බන්ධතාවයක්, සන්නිවේදනයක් සහ සහයෝගීතාවයක් ඇති කිරීම සඳහා පුළුල් හා ඵලදායී උපාය මාර්ග යක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කළ යුතුය.

3. ඔවුන් සිටින රැකවරණ ස්ථානය හෝ ඔවුන් රැකවරණය අත්හරින වයස කුමක් වුවත්, රැකවරණයෙන් ඉවත්ව යාමේ ක්‍රියාවලිය මඟින් ආබාධිත පුද්ගලයින් ද ඇතුළුව සියලුම රැකවරණ හැරයන්නන්ට උසස් අධ්‍යාපන, වෘත්තීය හා රැකියා අවස්ථා ලබා දෙන බවට සහතික විය යුතුය. මේ සම්බන්ධයෙන්, රැකවරණයෙන් ඉවත්ව යන අයට ඔවුන්ගේ සේවා නියුක්තියේ කුසලතා ඉහළ නැංවීමට සහ යෝග්‍ය රැකියා සඳහා ප්‍රවේශ වීමට සහාය වන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම. මෙය 2019 ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තියේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට ද ඇතුළත් කළ යුතුය. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ද ඇතුළුව තරුණ හා රැකියා සම්බන්ධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීමේ දී මෙම තරුණ කණ්ඩායමෙන් විමසා ඔවුන්ගේ නිශ්චිත තත්වයන් සහ අවශ්‍යතාවයන් ද සලකා බැලිය යුතුය.

4. වෘත්තීය පුහුණුව සහ අධ්‍යාපන සුදුසුකම් මෙන්ම රැකවරණයෙන් ඉවත්ව යන තරුණ තරුණියන්ට ඔවුන් තෝරාගත් ව්‍යවසායකත්ව අවස්ථා ලබා දීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා සමාගම් සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගැනීම. ගුණාත්මක තත්ත්ව සහතික කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමෙන් නිපුණතා සංවර්ධන වැඩසටහන් සහ ව්‍යවසායකත්ව මැදිහත්වීම්වල ගුණාත්මකභාවය සහතික කල යුතුය.

5. මුල් ළමාවිය අධ්‍යාපනයේ සිටම ආරම්භ කරමින් මෘදු කුසලතා සංවර්ධනය අධ්‍යාපන විෂය මාලාවට ඇතුළත් කල යුතුය. මන්ද, එවැනි කුසලතා ගොඩනැගීමට ශක්තිමත් මානව ප්‍රාග්ධන පදනමක් මූළික වේ. සංකීර්ණ ගැටළු විසඳීම වැනි උසස් සංජානන කුසලතා , කණ්ඩායම් වැඩ වැනි සමාජ-චර්යාත්මක කුසලතා සහ තර්කනය සහ ස්වයං-කාර්යක්ෂමතාව වැනි අනුවර්තනය වීමට පහසුකම් සපයන කුසලතා මෙයට ඇතුළත් වේ. ඊට අමතරව, ළමුන් හා යෞවන යෞවනියන් තුළ අත්‍යවශ්‍ය ජීවන කුසලතා ඇති කිරීම සඳහා විකල්ප රැකවරණ සේවා සපයන්නන්ට සහාය වීමෙන් රැකවරණයෙන් ඉවත් වීමෙන් පසුව ඔවුන්ට වෘත්තීය කටයුතුවල දී සහ ස්වාධීනව ජීවත්වීමට හැකියාව ලැබේ. විශේෂිත වැඩසටහන් තුළින් ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා විකල්ප රැකවරණය තුළ සිටින ළමයින්ට සහ තරුණ තරුණියන්ට ලබා දීම ද තීරණාත්මක වේ. එවැනි වැඩසටහන් සඳහා සම්පත් රජය විසින් වෙන් කළ යුතුය.

6. මූල්‍යමය ආධාර සම්බන්ධයෙන්, පුද්ගලික සමාගම් සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන් ව්‍යාපාරයන්ට පිවිසෙන රැකවරණය අත්හරින්නන් සඳහා වැඩිදුර අධ්‍යාපනය සහ ආරම්භක ප්‍රාග්ධනය සඳහා සහාය ලබා දීම. මේ සඳහා විශේෂයෙන් අරමුදලක් පිහිටුවීම යෝග්‍ය වේ.

7. විශේෂයෙන් චර්යාත්මක ගැටළු සඳහා එක් ළමා රැකවරණ ආයතනයක සිට තවත් ආයතනයකට ළමයින් මාරු කිරීමෙන් වැළකී සිටීමෙන් රැකවරණයෙහි ස්ථාවරත්වය සහතික කළ යුතුය. ඒ වෙනුවට, රාජ්‍ය, පෞද්ගලික හා ස්වේච්ඡා සේවා සපයන්නන් මගින් පුහුණුව ලබා දීම සහ ඒවා වෙත වඩා හොඳ ප්‍රවේශයක් ලබා දීම තුළින් දරුවන්ට වඩා හොඳ මනෝ සමාජීය හා පුනරුත්ථාපන සහාය ලබා දීම සඳහා රැකවරණ ආයතනවලට සහාය විය යුතුය. මේ සඳහා සේවා සපයන්නන්ගේ පුළුල් දත්ත ගබඩාවක් සහ කාර්යක්ෂම යොමු කිරීමේ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

8. විකල්ප රැකවරණය තුළ සිටින / ඉවත් වී යන ළමයින් සහ තරුණ තරුණියන් විනිශ්චයට ලක් කිරීමකින් හෝ වෙනස්කොට සැළකීමකින් තොරව සංවේදනය, සංවේදීතාව, දයානුකම්පාව, ඉවසීම සහ ගෞරවය ලබා දීම පිළිබඳව අදාළ රාජ්‍ය බලධාරීන් උදා. විනිසුරුවන්, පොලීසිය සහ පරිවාස නිලධාරීන්, පාසල් බලධාරීන් සහ ළමා රැකවරණ ආයතන මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික සේවා සපයන්නන්, සේවා යෝජකයින් සහ සාමාන්‍ය ජනතාව සංවේදී කළ යුතුය. විනිසුරුවන් ඇතුළු රජයේ නිලධාරීන්ගේ පුහුණු විෂයමාලා සඳහා මෙම අංගය ඇතුළත් කිරීම සහ නොමිලේ හෝ නාමික ගාස්තුවකට රැකවරණය ලබා දෙන ළමා රැකවරණ ආයතනවල කළමනාකරුවන්, රැකබලා ගන්නන් සහ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සංවර්ධනය කළ යුතුය. යහපත් භාවිතාවන් ස්ථාපිත කිරීම, ළමයින් / තරුණ තරුණියන් කෙරෙහි ඔවුන්ගේ හැසිරීම අධීක්ෂණය කිරීම සහ ඔවුන් වගවීම පවත්වා ගැනීම සඳහා ඔවුන් නිතිපතා එවැනි වැඩසටහන් වලට නිරාවරණය කිරීම, අත්‍යවශ්‍ය වේ. මේ සඳහා ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

## 6.2 ප්‍රතිපත්ති සම්පාදකයින් වෙනුවෙන් වූ නිර්දේශයන්

1. ලබා ගත හැකි අධ්‍යාපනය, පුහුණුව සහ රැකියා අවස්ථා සඳහා තරුණයින්ට උපදෙස් දීම සහ යොමු කිරීම සඳහා පාසල් මට්ටමින් රජය විසින් මෙහෙයවනු ලබන වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ආරම්භ කළ යුතුය. රැකබලා ගන්නන් මනා අධ්‍යාපනයක් නොලබා ඇති විට දී සහ එබැවින් තම රැකවරණය යටතේ සිටින දරුවන්ට ඔවුන් විසින්ම මඟ පෙන්වීමට හැකියාවක් නොමැති අවස්ථාවන්හි දී එවැනි මුල පිරීම් විශේෂයෙන් වැදගත් වේ. මීට අමතරව, විශේෂයෙන් අවුරුදු 14-18 අතර ළමුන් ඉලක්ක කර ගනිමින් විකල්ප රැකවරණය තුළ සිටින ළමුන් සඳහා වරින් වර වෘත්තීය මාර්ගෝපදේශන කඳවුරු සංවිධානය කළ යුතුය.

2. විකල්ප සත්කාර සේවා සපයන්නන් සමඟ නිතිපතා සම්බන්ධ වී පාඨමාලා, පහසුකම් සහ පවතින අවස්ථා පිළිබඳ තොරතුරු බෙදා දිය යුතුය.

3. විකල්ප රැකවරණයෙන් ඉවත් වී යනතරුණ තරුණියන් හට සහනාධාර සහිත රැකියා ස්ථානගත කිරීම්, කෝටා සහ ශිෂ්‍යත්ව ලබා දිය යුතුය. මෙයට ආබාධ සහිත රැකවරණයෙන් ඉවත් වී යන පුද්ගලයින් වෙනුවෙන් වූ අන්තර්ග්‍රහණයකර ගැනීමේ වැඩසටහන් ද ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, රහස්‍යභාවය සහතික කිරීම සහ ආයතනය තුළ සමානාත්මතාවය මෙන්ම සදාචාරාත්මක හැසිරීම ප්‍රවර්ධනය කිරීම මගින් කාර්ය මණ්ඩලය හෝ සිසුන් විසින් මෙම යෞවන යෞවනියන්ට එරෙහිව වෙනස් කොට සැලකීම් නොවන බවට වගබලා ගත යුතුය. දිගුකාලීන ආයතනිකකරණය හේතුවෙන් මෙම තරුණ තරුණියන් තුළ කිසියම් අක්‍රමවත් හැසිරීමක් දක්නට ලැබෙන්නේ නම් ඔවුන් නින්දාවට පත් නොකිරීමට කාර්ය මණ්ඩලය සංවේදී විය යුතුය.

4. යෞවන යෞවනියන්ට තමන් කැමති භාෂා මාධ්‍යයක් තෝරා ගැනීමට නිදහස ලබා දෙමින්, ස්ව භාෂාවෙන්

මෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් ද පාඨමාලා ලබා දිය යුතුය.

5. පුහුණු කාල පරිච්ඡේදයෙන් පසුව, රැකවරණය හැරයන්නන්ට ආරක්ෂිත සේවා පරිසරයන් සහිත පිළිගත් ආයතනවල රැකියා පුහුණුව ලබා දෙන ක්‍රියාවලියක් සංවර්ධනය කළ යුතුය.

## 6.3 සේවා යෝජකයන් සඳහා නිර්දේශ

1. පුහුණු කාල පරිච්ඡේදයෙන් පසුව, රැකවරණය හැරයන්නන්ට ආරක්ෂිත සේවා පරිසරයන් සහිත පිළිගත් ආයතනවල රැකියා පුහුණුව ලබා දෙන ක්‍රියාවලියක් සංවර්ධනය කළ යුතුය.

2. තරුණ තරුණියන්ගේ කුසලතා සහ අධ්‍යාපන සුදුසුකම් මත පදනම්ව සාධාරණ වැටුපක් ලබා දිය යුතුය. ඔවුන් සූරාකෑමෙන් සහ ඔවුන්ගේ අවදානමට ලක්විය හැකි තත්වයෙන් සහ ඔවුන්ව ආරක්ෂා කිරීමට හෝ ඔවුන්ව මෙහෙයවීමට වගකිවයුතු වැඩිහිටියෙකු නොමැතිවීම වැනි තත්වයන්ගෙන් ප්‍රයෝජන ගැනීම ආදිය වළක්වා ගැනීම සඳහා පද්ධති ක්‍රමවේදයන් සකස් කරන්න. ඔවුන්ගේ කම්කරු අයිතිවාසිකම් පිළිබඳව ද ඔවුන්ව දැනුවත් කළ යුතුය. ඔවුන්ගේ වෘත්තීය වර්ධනයට සහාය වීම සඳහා ආරක්ෂිත සේවා පරිසරයක් සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අමතර අවධානයක් සහ මග පෙන්වීමක් ලබා දිය යුතුය.

3. ඔවුන්ගේ අනන්‍යතාවය, පවුල් පසුබිම, සමාජ තත්වය යනාදිය නොසලකා සියලුම සේවකයින්ට එක හා සමානව සලකන සේවා ස්ථානයේ සමානාත්මතාවයේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කළ යුතුය. සමානාත්මතාවයේ මූලධර්මය පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම සහ විවිධ පසුබිම්වල සිටින සම සේවකයින්ට ගෞරවයෙන් සැලකීමට ඔවුන් දිරිමත් කිරීම කළ යුතුය.

4. තරුණ තරුණියන්ට ඔවුන්ගේ ධාරිතාවය වර්ධනය කර ගැනීම, ඔවුන්ගේ ශක්තීන් හඳුනා ගැනීම, වෘත්තිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සහ ඔවුන්ගේ වෘත්තීන් පිළිබඳව දැනුවත් තීරණ ගැනීම සඳහා සීමාවාසික පුහුණුව සහ රැකියා සෙවන (job shadowing) අවස්ථා දිය යුතුය.

5. රැකවරණයෙන් ඉවත්ව යන තරුණ තරුණියන්ට උපදේශන වැඩසටහන් ලබා දීම, අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණු අවස්ථා සොයා ගැනීමට සහ සොයා යාමට ඔවුන්ට සහාය වීම අත්‍යාවශ්‍ය වේ. බොහෝ දෙනෙකුට තම ජීවිතයේ සමාජ සහයෝගය ලබා දිය හැකි කැපවූ වැඩිහිටියෙකු සමඟ කිසිදු සම්බන්ධයක් නොමැත. එබැවින් මෙම තරුණ තරුණියන්ට විශ්වාසනීය සබඳතා වර්ධනය කර ගැනීමටත්, විශ්වාසය හා සමාජ ප්‍රාග්ධනය ගොඩනඟා ගැනීමටත්, ඉගෙනීමට පහසුකම් සැලසීමටත්, ඔවුන්ගේ නිදහස කරා යන ගමනට සහාය වීමටත් උපදේශන වැඩසටහන් ප්‍රධාන වේ.

## 6.4 රැකවරණය සපයන්නන් සඳහා නිර්දේශ

1. පුහුණු කාල පරිච්ඡේදයෙන් පසුව, රැකවරණය හැරයන්නන්ට ආරක්ෂිත සේවා පරිසරයන් සහිත පිළිගත් ආයතනවල රැකියා පුහුණුව ලබා දෙන ක්‍රියාවලියක් සංවර්ධනය කළ යුතුය.

2. මෘදු කුසලතා ඇතුළුව කුඩා කාලයේදීම සේවා යෝජකයින් විසින් ඉල්ලා සිටින කුසලතා වර්ධනය කිරීමට තරුණයින්ට සහාය විය යුතුය. එමඟින් ඔවුන් ශ්‍රම බලකායට ඇතුළු වන විට ඔවුන්ගේ සේවා නියුක්තිකත්වය ඉහළ නංවනු ඇත. එබැවින්, රැකවරණ ක්‍රියාවළියෙන් ඉවත්වීමේ කොටසක් ලෙස නිපුණතා සංවර්ධන ක්‍රියාවලිය කුඩා කල සිටම ආරම්භ කළ යුතුය. මෙය පදනම් විය යුත්තේ දරුවා සමඟ සාකච්ඡාකොට පුළුල්ව විශ්ලේෂණය කිරීමෙන් සංවර්ධනය කරන ලද 'ළමා සංවර්ධන සැලැස්මක්' මත ය.

3. අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අවස්ථා පිළිබඳ නිවැරදි හා ප්‍රමාණවත් තොරතුරු සැපයීම සහ හොඳ රැකියා ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීම සම්බන්ධයෙන් තරුණ තරුණියන්ට නිවැරදි මග පෙන්වීමක් ලබා දිය යුතුය. තරුණ තරුණියන්ගේ කුසලතා, සුදුසුකම් සහ අභිලාෂයන්ට ගැලපෙන රැකියාවක් සොයා ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සහ සහාය ද මෙයට ඇතුළත් වේ. මෙම ක්‍රියාවලිය අඩු වැටුප් සහිත රැකියා ලබා නොගැනීම හෝ නිවාස නැතිකම වළක්වා ගැනීම සඳහා අධ්‍යාපන වැඩසටහන් සඳහා අඛණ්ඩව ඇතුළත් නොවීම සහතික කිරීමට මෙම ක්‍රියාවලිය උපකාරී වේ.

4. ළමයින්ට සහ තරුණ තරුණියන්ට ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය හා රැකියාවක නියුතු වීම ඇතුළුව ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා රැකබලා ගන්නන්ට පුළුල් හා අඛණ්ඩ පුහුණුවක් ලබා දිය යුතුය. වැදගත්ම දෙය නම්, ඔවුන්ගේ රැකවරණය ලබන දරුවන්ට 'මවක්' වීමට සහ ඔවුන්ට අනුකම්පාව, අවබෝධය, සංවේදීතාව, ඉවසීම සහ ගෞරවය දැක්වීම සඳහා ඔවුන්ව පෙළඹවීම සහ දිරිගැන්වීම් ලබා දීමයි.

5. සම්මුඛ පරීක්ෂණය අතරතුර දී මෙන්ම රැකියා ස්ථානයේ දී තරුණ තරුණියන් අවදානමට ලක්වීම වළක්වා ගැනීම සඳහා ඔවුන් සේවා යෝජකයා වෙත යොමු කරනු ලබන විට දී ඔවුන්ගේ පසුබිම පිළිබඳව දැනුවත් කළ යුතුය. තරුණයා රැකියා ස්ථානයේ හොඳින් ස්ථානගතවනු තුරු, ඇයගේ / ඔහුගේ ආරක්ෂාව, යහපැවැත්ම සහ ප්‍රගතිය සහතික කිරීම සඳහා අවම වශයෙන් යම් කාලයක් සඳහා සේවා යෝජකයා සමඟ අඛණ්ඩව සම්බන්ධතාවය පවත්විය යුතුය.





*Illustration 2: The Connect*

## අප හා සම්බන්ධ වන්න.


**ශ්‍රී ලංකා එස් ඕ එස් ළමා ගම්මාන පිළිබඳ දැන ගැනීමට**

**දිවාකර් රත්නදුරේ - ජාතික අධ්‍යක්ෂ**

දු. ඇ: + 9411 2 703 890

ජංගම දු. අ : + 94 777 689 631

විද්‍යුත් තැපෑල : divakar.ratnadurai@soscvsrilanka.org

**කීර්ති හෙට්ටිආරච්චි - නියෝජ්‍ය ජාතික අධ්‍යක්ෂක**

දු. ඇ: + 94 11 2 703 890

ජංගම දු. ඇ: + 94 777 689 636

විද්‍යුත් තැපෑල : kirthi.hettiarachchi@ soscvsrilanka.org

**වැඩසටහන් පිළිබඳව දැන ගැනීමට**

**ධනංජය පෙරේරා - වැඩසටහන් අධ්‍යක්ෂක**

දු. ඇ: + 94112602470

ජංගම දු. ඇ: + 94773926804

විද්‍යුත් තැපෑල : dananjaya.perera@ soscvsrilanka.org

**යෞවන වැඩසටහන් පිළිබඳව දැන ගැනීමට**

**කපිල ගුණවර්ධන - අධ්‍යක්ෂක - ජාතිත තරුණ කටයුතු**

දු. ඇ : + 94 11 4 013 933

ජංගම දු. ඇ: + 94 777 689 630

විද්‍යුත් තැපෑල : kapila.gunawardhana@soscvsrilanka.org


SOS ළමා ගම්මාන ශ්‍රී ලංකාව


© SOS ළමා ගම්මාන ශ්‍රී ලංකාව 2019